## කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2011
2013 මැයි - අගෝස්තු

මානවශාස්ත්‍ර පීඨය

නාට්‍ය හා රංග කලාව - **DMAT E1015**

රංග කලාවේ මූලිකාංග

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

01. පෙරදිග හා අපරදිග රංග කලාවේ ප්‍රභවය සිදුවූ ආකාරය විස්තර කරන්න.

02. නාට්‍යයක තිබිය යුතු මූලික ලක්ෂණ කවරේ දැයි භරතමුනි සහ ඇරිස්ටෝටල්ගේ නාට්‍ය සිද්ධාන්ත ඇසුරින් විග්‍රහ කරන්න.

03. "ට්‍රැජඩි" සහ "කොමඩි" නාට්‍ය ප්‍රභේද පිළිබඳ විවරණයක් කරන්න.

04. අපරදිග නාට්‍ය කලාවේ විකාසය සිදුවූ ආකාරය සහ එහි ප්‍රවණතා සැකෙවින් විස්තර කරන්න.

05. වේදිකා නාට්‍ය අන් කලා මාධ්‍යයන් සමග සන්සන්දනය කරමින් එහි ඇති සීමා සහ ශක්‍යතා විස්තර කරන්න.

06. කතා වින්‍යාසය (Plot) පිළිබඳ කාව්‍ය ශාස්ත්‍රයේ සහ නාට්‍ය ශාස්ත්‍රයේ දක්වා ඇති අදහස් පැහැදිලි කරන්න.

07. කිසියම් නාට්‍ය නිර්මාණයක උසස් පහත් බව තීරණය කිරීමේ දී වැදගත් වන කරුණු පිළිබඳ විමසීමක් කරන්න.

08. "රූපණය යනු දෛනික ජීවිතයේ දී මිනිසුන් අවිඥානක ව කරන දේ වේදිකාව මත සවිඥානක ව කිරීමයි." විමසන්න.

09. සම්මත හා අසම්මත රංග කලාව යනු කුමක් දැයි නිදසුන් සහිත ව පැහැදිලි කරන්න.

10. "සෑම නාට්‍යයක් ම කිසියම් ගැටුමක් විදහා දැක්විය යුතු ය. ගැටුම නාට්‍යයේ අනිවාර්ය අංගයකි." මෙම ප්‍රකාශය විචාරාත්මක ව විමසා බලන්න.

*********************************